
# ඉතිහාසයේ මහා පාවාදීම ශ්‍රීලංකාවේ සිදුවිය

## තොපට රජෙක් ඇත කුඹියනේ - අපට රජෙක් නැත කුඹියනේ
## තොපේ මොළේවත් නැති ගැතිවුන්නේ - අපේ රජා බැඳ පාවාදුන්නේ





ශ්‍රී වික්‍රම රාජසිංහ රජු

සිංහල රාජ්‍යයේ වැටීම විදහා දක්වන 1818 දී ඉංග්‍රීසි සිත්තරෙකු විසින් අඳින ලද වම්පස ඇති සමූහ පින්තූරය ඇතුළු තවත් පින්තූර බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ සුරක්ෂිතව තබා ඇත. එකල ඡායාරූප ශිල්පය නොතිබූ බැවින් යුද්ධ හා සටන් සිදුවන ස්ථානවලට චිත්‍ර ශිල්පීන් ගෙනයන සිරිතක් වීය. අද කැමරා වෙන් කෙරෙන කාර්‍යය ඔව්හු ඒ ස්ථාන වලදී කැන්වස් රෙද්දේ පින්සල් හා සායම් භාවිත යෙන් එදා සටහන් කළහ.

**මා**නව ඉතිහාසයේ සිදුවූ මහා පාවාදීමේ කතාන්තරය කියන, ඉහත චිත්‍රය දෙස බලන්න. මේ 1815 පෙබරවාරි මස 18 වන දින සිංහලේ අවසාන රජු වන ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා සිය බිසෝවරුන් සිව්දෙනා සමග බෝමිරියේ ආරච්චිගේ නිවසේ සැඟ වී සිටිය දී උඩරට සිංහල නිළමෙවරුන්ගේ ද සහාය ඇතිව ඉංග්‍රීසීන් විසින් අල්ලා ගන්නා ලද අවස්ථාවයි.

රජුගේ දෑත් වැල්පටෙන් බැඳ එළියට ඇදගෙන එන්නේ සිංහල නිළමෙ කෙනෙකි. ඔවුන් රජුගේ මුහුණට කෙළ ගසා ඇදගෙන විත් ඉංග්‍රීසි සෙන්පතියාගේ පාමුළට ඇද දැමූ බව ඉතිහාස පොතේ සඳහන් වෙයි. සිංහලයන් එසේ අවඥා සහගත, තුච්ඡ අන්දමට තම රජුට සළකද්දී, තමා යටතට පත් නමුත් මේ ඉන්නේ රටේ රජු නොවේදැයි යන සිතුවිල්ලෙන් ඉංග්‍රීසි සෙන්පතියා රජුට ආචාර ගෞරව දක්වන ආකාරය ද මැනවින් මෙහි පෙන්නුම් කෙරේ.

කන්ද උඩරට රාජධානියේ අවසාන යුගයේ රජකම් කළෝ දකුණු ඉන්දීය නායක්කර් වංශික රජ පෙළපතින් එන රජවරු වෙති. රටවැසියෝ ඔවුන් සිංහල රජවරු ලෙස පිළිගත්හ. රාජාධිරාජසිංහ රජුගේ කාලයේ, එනම් 1796 දී ඉංග්‍රීසීහු ලංකාවේ මුහුදුබඩ පළාත් ලන්දේශීන් ගෙන් ඩැහැගත්හ. එයින් දෙවසරකට පසු රාජාධිරාජසිංහ රජ පරලෝ සැපැත් විය.

ඉන්පසු රජකම හිමි විය යුතුව තිබුණේ මුත්තුසාමි කුමාරයාට ය. එහෙත් පිළිමතලාවේ මහ අධිකාරම මෙහිදී කපටිකමක් කර ළාබාල වියේ සිටි කන්නසාමි කුමාරයා රජකමට පත් කරන්නට කටයුතු කළේ ය. අධිකාරමගේ සැබෑ අදහස වූයේ පසු කලෙක රාජ්‍යය ලඳ බොළඳ කන්නසාමිගෙන් උදුරා ගෙන තමා යටතට ගන්නට ය. කන්නසාමි, ශ්‍රී වික්‍රම රාජසිංහ ලෙස කන්ද උඩරට රජ වූයේ ය. එහෙත් ඔහු අධිකාරමට නටවන්නට හැකි ළපටියෙක් නොව ශූර බුද්ධියක් ඇත්තෙකු වීය.

තම අදහස් ඉටු නොවන බව දත් පිළිමතලාවේ අධිකාරම රජු සිහසුනෙන් පන්නා දැමීමට ඉංග්‍රීසීන්ගේ සහාය පැතීය. මේ වන විට ඉංග්‍රීසීන් සිටියේ ලංකා රාජ්‍යය මුළුමනින්ම අත්පත් කරගන්නේ කෙසේ දැයි කල්පනා කරමිනි. රජු හා සිංහලේ ප්‍රධානීන් අතර ආරවුල් ඊට හොඳම මග බව ඔවුනට වැටහිණ.

මහ අධිකාරම ඉංග්‍රීසින් සමග තමා රජකමෙන් පහ කරන්නට කුමන්ත්‍රණ කරන බව රජුට සැළවිය. රජු වරක් දෙවරක් ඔහුට සමාව දුන්නද දිගටම ඒ කුමන්ත්‍රණය දියත් කෙරෙන බව දැන කෝප වූයේ ය. රජුගේ අණ පරිදි පිළිමතලාවේ මරණයට පත්කරනු ලැබිණ.

පිළිමතලාවේගෙන් පසු ඒ තනතුරට පත් වූයේ ඔහුගේ බෑණා වන ඇහැලේපොළ නිළමේ ය. තම මාමා මැරවූ නිසා රජු සමග කෝප වී රජුට එරෙහිව සිංහල මිනිසුන් යොදවා කැරළි කෝලාහල ඇති කරන බවත් ඔහු ඉංග්‍රීසීන්ට එකතුවන්නට යන බවත් ශ්‍රී වික්‍රම රාජසිංහ රජුට ආරංචි වූයේ මෙහෙදී ය. රජු ඔහුට වහාම තමා හමුවන ලෙස නියෝග කළ නමුත් ආවොත් සිදුවන්නේ කුමක්දැයි දත් ඇහැළේපොළ ඉංග්‍රීසීන්ගේ රැකවරණ පතා කොළඹට පැන ගියේ ය. රජු ඔහු නිලයෙන් පහකර ඔහු සතු ඉඩකඩම් රාජ සන්තක කොට අඹු දරුවන් ද සිර කළේ ය.

ඉංග්‍රීසීන්ගේ උදව් ඇතිව ඇහැලේපොළ උඩරට ආක්‍රමණය කරන්නට අර අඳින බව රජුට ආරංචි විය. රජු කළේ රාජද්‍රෝහි වීමේ වරදට එවකට සිංහල රාජ නීතියට අනුව ඇහැලේපොල කුමාරිහාමි සහ දරුවන් මරණීය දණ්ඩනයට කැප කිරීමයි. එම ඝාතන නිසා රජු කෙරෙහි වැසියෝ දැඩි ලෙස කෝප වූහ.

කොතෙක් දුර්වලතා තිබුණද රාජසිංහ රජු කළ බොහෝ හොඳ දේ ද ඉතිහාසයේ ලියැවී තිබේ. මහනුවර රාජ්‍යයේ පාරම්පරික ශාපය වූ රදළ බලය මැඩ පවත්වමින් මධ්‍යම පංතියේ හා දුප්පතුන්ගේ හිතවතෙකු ලෙස ක්‍රියා කළ රජු සමාජවාදී අදහස් දැරූ කෙනෙකු බව කොඩ්රින්ටන්ගේ ඉතිහාස පොතේ සඳහන් වෙයි. දර්ශණීය නුවර වැව ද, පත්තිරිප්පුව ද කරවූයේ ඔහු ය. නුවර වැවට යටවූ මල්වත්තේ කුඹුරු වලට වන්දි වශයෙන් ගම්පලින් කුඹුරු පිරි නැමුවේ ය. අත්‍යවශ්‍ය භාණ්ඩවල මිළ පාලනය කළේ ය. මත්පැන් තහනම් කළේ ය.

උඩරට රදළ නායකයන්ගේ උපකාර ඇතිව සෙංකඩගල ආක්‍රමණය කළ ඉංග්‍රීසීහු බෝමුරේ ආරච්චිගේ ගෙය වටලා එහි සැඟවී සිටි රජු අල්ලා ගත්හ. උඩරට සිංහලයෝ තම රටේ රජු එළියට ඇදගෙන අවුත් පර සතුරාගේ දෙපාමුලටම හෙළමින් ඉතිහාසයේ මෙතෙක් කිසිම ජාතියක් නොකළ අන්දමේ මහා දීන, අධම පාවාදීම සිදු කළහ. තමා මේ කරන්නේ තම රටේ නිදහස, ස්වෛරී භාවය සහ තම ගෙලද දංගෙඩියේ තැබීම නොවේදැයි ඒ අමන, කාලකණ්ණි, තකතිරුවෝ මඳකටවත් නොසිතූහ.

ඒ මහා තිරශ්චීන දිනයෙන් ශ්‍රීලංකාවේ රාජවංශය අහෝසි විය. විජය රජුගේ පටන් රජවරුන් රැජිණන් 174 දෙනෙක් රජ කළ අප රටේ අභිමානය, පෞරුෂත්වය හා රාජත්වය අපේ අමන ජනයෝ පරසතුරන්ට පාවා දුන්නෝ ය. අප ඉතිහාසයේ මහා විනාශය යයි කිවහැකි උඩරට ගිවිසුම 1815 මාර්තු 2 වෙනිදා මහනුවරදී අත්සන් කිරීමෙන් ශ්‍රීලංකාවේ පාලනය මුළු මනින්ම ඉංග්‍රීසීන් සතුවිය.

තමන් කළ අමනකමේ විපාකය විඳින්නට සිංහලයින්ට වැඩි කල් ගියේ නැත. සුද්දන්ගේ නොයෙක් අතවරවලට ගොදුරුවන්නටද මැරුම් කන්නටද ඔවුන්ට සිදුවිය. තමන් ගේම රජෙකුගේ අගය තේරුණත් එතකොට ප්‍රමාද වැඩි ය.

සුද්දන් පාලන බලය ගෙන වසර කීපයකට පසු දිනක කුංකුණාවේ හාමුදුරුවෝ තම පන්සලේ බිම කූඹින් රැළක් යනු දුටහ. නායක කූඹියා ඉදිරියෙන් ද සෙසු කූඹීහු නායකයා පසු පස ද ගමන් ගත්හ. හාමුදුරුවෝ අඟුරු කැල්ලක් ගෙන පන්සල් බිත්තියේ මේ කවිය ලියූහ..

**අනේ කුඹින්නේ**
**තොපටත් රජෙක් ඉන්නේ**
**අපට නැත ඉන්නේ**
**ඉන් නිසාවද අප තැවෙන්නේ**
**රජෙක් ලැබුණෝතින්**
**කොඩි සේසත් නගකඳ්කඳං**
**පෙරහැර කරකඳ්කඳං**
**සාදු නාදෙන් ගිගුම් දෙකඳ්කඳං**

♦ *දයා ආනන්ද*

## ඉතින් ආයුබෝවන් !

**කන්ද උඩරට අන්තිම සිංහල රජු වූ ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා ඉංග්‍රීසීන් විසින් අල්ලාගනු ලැබ රටින් පිටුවහල් කර නැවට නැංවූ අවස්ථාවේ රජතුමා තුළ පහළ වූ සිතුවිලි තවමත් නම නොදන්නා පැරණි කවියෙකු විසින් රචනා කර තබා ඇත්තේ මෙසේ ය.**

දෙදහස් වසක් සිට අප සතුව පැව තිය
නිදහස් කිරුළ අද සතුරන්ට අයි තිය
උදහස් කම නිසා සිය දනගෙ විම තිය
නිදහස් බව නසාගති සිහල ජා තිය

ඇහැලේ පොලගෙ රැවටිලි බස් ගෙන නිම්මේ
සිහලේ රදළවරු අදහා ගෙන පෙම්මේ
තුමුලේ සිහල රද පෙළ වනසා දැම්මේ
සිහලේ චතුරදෝ දැන් සිරි ලක් අම්මේ

නීතිය මගෙ නොවේ එය දැනගත් නමුදු
බීතිය සිදු කළේ ඇහැලේපොළ මැතිඳු
ජාතිය රට සමය ඉන් සිහසුනද ඉඳු
පීතිය සිතින් පරසතුරන් වෙතම පිදු

අපා යට බියෙන් මත්පැන් නොබිව් මට
උපා යෙන් පොවා යළි මා ගෙන සතුට
පපා දර සිටිය සුරතල් කුමරු සෙට
කපා දැමූ බැවින් විය සතුරන්ට රට

නොකළෙමි කිසි දොසක් මගෙ සෝවුරන් වෙත
දැරුවෙමි රටෙහි දියුණුව පිණිස නන් තැත
ඉවසමි මහත් දුක් ඉන් මේ ලෙසින් පත
සනසමි අහෝ කෙලෙසින් බොළඳ වෙන්කත

නෙකදුක් සැවොම විඳිමින් සොමි ගුණෙන් යුතා
විතරක් නොවන වැඩ සැදූ මහ දනන් වෙතා
සිරිවික් මන් නමැති සුරතල් ඔබේ පුතා
අදදුක් විඳින සිරකරුවෙකි අහෝ ඉතා

විහිදා දසත සරසන මිණි කිරණ රැසේ
දළදා මැදුර රන්කොත සමග නුබ කුසේ
මහදා ගැබ් සිරස දිසි කොත් කැරලි වැසේ
පැහැදා පෙනේ තවමත් මට උතුරු දෙසේ

සවැනිය මුනි සඳුගෙ සිරිපද මන කල්ල
ගිහිණිය සුමන ගිරි පෙර දිග සිරි දුල්ල
රමණිය අවර දෙස දිසි අත්තන ගල්ල
කැළණිය සහ පෙනේ තව පොල්තුරු නිල්ල

උපනිමි ඔබේ කුස මෙලෙසින් පිරි රුසිරු
දැරුවෙමි කිරුළ විඳිමින් සැම රජ ඉසුරු
සුරැකිමි ඔබේ දරුකැළ බිඳිමින් සතුරු
හැරයමි දුකින් අද ඔබ ලක් මවුනි ගරු

නොවහිමි යසස් දැරූ සිරිලක් මැණිය නී
නමදිම් මහත් ගුණ ඔබ සිහිකර ඉති නී
රජකම් කළත් කළකම් පළදෙන බැවි නී
මෙතරම් දුකක් සිදුවිය මගෙ පෙර පවිනී

අහෝ ගණඳුරයි අද පෙරදිග මැණික
හොහෝ හඬ නැගෙයි හදවතෙහි ටික ටික
සහෝ දර පිරිසගෙන් පැමිණි මේ දුක
කොහෝ මවත් ඉවසමි සතුටින් නිසැක

විකුම් සිහල පරපුර සිහි තිබෙන තුරු
උතුම් රාජ ලේ ටික මගෙ තිබෙන තුරු
නෙතින් කඳුළු නොහෙළමි දිවි තිබෙන තුරු
ඉතින් ආයුබෝවන් ලක්මවුනි ගරු

## චෞර කත නිරුවත්කර පැට්‍රල් දමා ගිනිතබති

**ඇ**ය ලතින් ඇමරිකාවේ ගෝතමාලා ප්‍රධාන නගරයේ බස් මගීන් කොල්ලකන හොරමුලකට අයත් තැනැත්තියකි. ඇයද ඇයගේ සහචරයන් තිදෙනෙක්ද බස් රථයක් කොල්ලකද්දී මගීහු ඔවුන් අල්ලාගත්හ. ඉක්බිති ජනතාව ඒ හොර කල්ලිය නගර මධ්‍යයට ගෙන අවුත් දඬුවම් පමුණුවන්නට සූදානම් වෙද්දී පිරිමි හොරු තිදෙන බේරී පැන ගියෝය. එහෙත් හෙරට එසේ පැන යන්නට නොහැකි විය. මිනිස්සු ඇය නිරුවත්කර පාර මැද හිඳුවා හිසට පැට්‍රෝල් වත්කර ගිනිතැබූහ. ඒ සමගම පැමිණි පොලීසිය එම ගින්න නිවා ඇය අත්අඩංගුවට ගෙන රැගෙන ගියහ. මෙවැනි සිද්ධීන් ගෝතමාලාවේ ඉතා සුලභය. අපරාධකාරයින්ට දඬුවම් පමුණු වන සිවිල් විජිලන්ට් කල්ලි එහි ගණනාවකි. එසේම අපරාධ සංඛ්‍යාවද දිනෙන් දින එහි ඉහළ යයි. ගිය වසරේ පම ණක් ගෝතමාලා නගරයේ හොර කල්ලි මිනිසුන් 250කට වඩා සංඛ්‍යවකගෙන් කොල්ල කා ඇති අතර, 40 ක් ඝාතනය කළහ.

අපරාධකාරයින්ට මෙන්ම ඔවුන් අත අඩංගුවට ගන්නා පොලිස් නිලධාරීන්ටද මිනිස්සු ඇතැම් විට පහර දෙති. මෑතකදී ස්ත්‍රී දූෂක යෙකුට උසාවියේදී දුන් දඬුවම ප්‍රමාණවත් නොවන ලිහිල් එකක් යයි නිගමනය කළ ජනතාව විනිසුරුවර යාටද පහරදුන්හ.

ජනතාව නීතිය අතටගෙන තමන්ම අපරාධකරුවන්ට දඬුවම් කිරීමේ මෙම පුරුද්ද හටගත්තේ 1960 සිට 1996 දක්වා වසර 30 ක් පුරා පැවති සිවිල් යුද්ධයේදී පිහිටවූ සිවිල් ආරක්ෂක බලකාය යොදා ගෙන එහි රජය වාමාංශික විප්ලවකාරයින් වූ සාමාන්‍ය වැසියන් විශාල ප්‍රමාණයක් අමු අමුවේ ඝාතනය කිරීම ආරම්භ කළ දා සිටය. ඉන් ජනතාව 200,000කට වඩා මියගොස් ඇති බව ගණන් බලා ඇත.

